

# 17

# سُوْرَةُ الضُّحٰى

# සූරා අල් ලුහා

අල්ලාහ් විසින් දායාද කරන ලද ධර්මය වූ අල්කුර්ආනයේ 93 වන පරිච්ඡේදය සූරතුල් ලුහා වේ. මෙම සූරාවේ ආයත් 11ක් අන්තර්ගත වේ. මෙහි වචන 40ක් ද අක්ෂර 164ක් ද දක්නට ලැබේ. ෆජ්ර් සූරාවට පසුව මක්කාවේ පහළ කරන ලද මෙම සූරාවේ ප්‍රථම ආයතය ද, ප්‍රථම වචනය ද වන “අල් ලුහා” යන පදය මෙහි නාමය ලෙස නම් කර ඇත. “හිමිදිරි පාන්දර” යන්න මෙහි අදහස වේ.

## පහළ කරන ලද පසුබිම

නබි මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාට අල්ලාහ්ගෙන් පහළ වෙමින් පැවති වහී පහළ වීමට දින කිහිපයක් ප්‍රමාද විය. ජිබ්රීල් අලෛහිස්සලාම් තුමා සමඟින් වූ සබැඳියාව ද බිඳී ගියේ ය. මෙය සැළ වූ වහා ම මුෂ්රික්වරු සරදම් කළහ. “මුහම්මද්ගේ දෙවියන් විසින් මුහම්මද් අත්හරින ලදී, ඔහු ළඟට පැමිණෙමින් සිටි ෂෛතාන්ගේ පැමිණීම ද අවසන් විය,” යනුවෙන් විහිළු කළ අය අතර අබූ ලහබ්ගේ බිරිඳ වූ අල් අව්රා බින්ත් හර්බ් නමැත්තිය විශේෂිත තැනැත්තියකි. සතුරන්ගේ විමර්ශන, උසුළු විසුළු හමුවේ මුහම්මද් සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා සිත්තැවුලින් පසු වන අවස්ථාවේ දී මෙම සූරාව පහළ විය.

## සූරාව හා එහි අර්ථය

بِسْمِ اللَّهِ الرَّحْمَٰنِ الرَّحِيمِ
وَالضُّحَىٰ ﴿١﴾ وَاللَّيْلِ إِذَا سَجَىٰ ﴿٢﴾ مَا وَدَّعَكَ رَبُّكَ
وَمَا قَلَىٰ ﴿٣﴾ وَلَلْآخِرَةُ خَيْرٌ لَّكَ مِنَ الْأُولَىٰ ﴿٤﴾ وَلَسَوْفَ
يُعْطِيكَ رَبُّكَ فَتَرْضَىٰ ﴿٥﴾ أَلَمْ يَجِدْكَ يَتِيمًا فَآوَىٰ ﴿٦﴾
وَوَجَدَكَ ضَالًّا فَهَدَىٰ ﴿٧﴾ وَوَجَدَكَ عَائِلًا فَأَغْنَىٰ ﴿٨﴾
فَأَمَّا الْيَتِيمَ فَلَا تَقْهَرْ ﴿٩﴾ وَأَمَّا السَّائِلَ فَلَا تَنْهَرْ ﴿١٠﴾
وَأَمَّا بِنِعْمَةِ رَبِّكَ فَحَدِّثْ ﴿١١﴾

1. දීප්තිමත් (ආලෝකයක් ඇති) හිමිදිරිය මත දිවුරමින්.
2. රාත්‍රිය මත දිවුරමින් එය නිශ්චල වන විට.
3. (නබි මුහම්මද්) නුඹගේ පරමාධිපති නුඹ අත්හැර දැමුවේ ද නැත; අමනාප වූයේ ද නැත.
4. තව ද පසු කාලය, පෙර කලට වඩා නුඹට යහපත් වන්නේ ය.
5. තව ද (නුඹ තෘප්තිමත් වන පරිදි) නුඹගේ පරමාධිපති නුඹට දයාද කරන්නේ ම ය. (එවිට) නුඹ තෘප්තිමත් වන්නෙහි ය.
6. ඔහු නුඹ අනාථයකු සේ නුදුටුවේ ද? පසුව ඔහු (නුඹට) නිසි රැකවරණය ලබා දුන්නේ ය.
7. තව ද ඔහු නුඹ මග නොදුටු කෙනෙකු සේ දැක්කේ ය. පසුව ඔහු (නුඹට) ඍජු මග පෙන්වා දුන්නේ ය.
8. තව ද ඔහු නුඹ දිළින්දකු සේ දැක්කේ ය. පසුව ඔහු (නුඹ) ධනවත් කළේ ය.
9. එබැවින් අනාථයින් කෙරෙහි නුඹ කුරිරු නොවනු.
10. තව ද නුඹ යාචකයන් පළවා නොහරිනු.
11. තව ද නුඹගේ පරමාධිපතිගේ දයාදය ගැන (සැමට ම) ප්‍රකාශ කරනු.

## මූලික අදහස

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාට අල්ලාහ්ගෙන් පැමිණි වහී එකවර ම නතර විය. එහෙයින් එතුමාගේ විශ්වාසයේ උල්පත සිඳී ගියේ ය. දේව ස්නේහ සුවඳ බිඳී ගියේ ය. දරා ගත නොහැකි ශෝකයට පාත්‍ර වී පාළු හැඟීමෙන් හුදකලා වූවකු සේ දුකට පත් වී සිටියේ ය. මෙවැනි පසුබිමක මෙම සූරාව පහළ විය. මෙමගින් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණන් කෙරෙහි ආදරය, රැකවරණය, සෙනෙහස, අනුකම්පාව, කරුණාව, ගරුත්වය, ස්නේහය, ඇල්ම, විශ්වාසය යන සියල්ල ම පිරී ඉතිරෙන්නට විය. මෙමගින් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාණෝ අසීමිත සතුටට පත් වූහ.

නුඹව අතහැර දැමුවේ නැත, ප්‍රතික්ෂේප කළේ නැත, අමතක කළේ නැත, නුඹ සමඟින් කෝප වූවේ නැත, නුඹ කිසිවිටක අත නොහරින්නෙමු, නුඹට කිසි දු අඩුවක් නොතබන්නෙමු, මෙලොව පිරිනැමූ යහපතට වඩා ඉතා විශේෂිත දේ නුඹ වෙනුවෙන් පරමාන්ත දින මග බලමින් ඇත, යනාදී වචනවලින් නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාට සැනසිලි බස් කියනු ලැබිණි.

නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමා වෙත අල්ලාහ්ගේ ආදරය හා සෙනෙහස උතුරා ඇත. අනාථයකු ලෙස උපන් එතුමා අල්ලාහ් විසින් රැක ගනු ලැබිණි. සෙනෙහස පානු ලැබිණි; දිළිඳු බවින් මුදවා එතුමා සමෘද්ධිමත් කරනු ලැබිණි, යැයි සඳහන් කර පෙන්වා දී ඇත.

අවසාන වශයෙන් අනාථයින්ට තර්ජනය කිරීම, ඔවුන් වෙත බලපෑම් කිරීම, ඔවුන්ට අවමන් කිරීම, නින්ද කිරීම හෝ දඬුවම් කිරීම නොකළ යුතු බවත්, එසේ ම යාචකයන් සමඟ යහපත්ව හා ගෞරවනීයව හැසිරෙන ලෙසත් ආයාචනා කරන්නේ ය.

## සූරාවේ අන්තර්ගත දේශනා

01. යහපත් වැසියන් අල්ලාහ් අත නොහරින බව හා ඔවුන්ට දේව ආදරය ද සෙනෙහස ද ලැබෙමින් පවතියි, යන විශ්වාසයේ උල්පත සිත් පතුලෙහි සටහන් කිරීම.

02. මෙලොවේ දීත් පරලොවේ දීත් අල්ලාහ් යහපත ලබා දෙන්නේ ය, මෙලොව ඇති සියල්ලට ම වඩා පරලොව ඇති සියල්ල ම ශ්‍රේෂ්ඨ ය, යැයි පැවසීම තුළින් පරලොව ජීවිතය පිළිබඳ ඇල්ම වැඩි කරන්නේ ය.

03. අනාථයින්ට සැලකිය යුතු ය, ඔවුන්ට වාසස්ථාන සපයා දිය යුතු ය, යාචකයන්ට උපකාර කර පිහිට විය යුතු ය, කිසිවිටෙක ඔවුන්ට අවමන් කිරීම හෝ අපහාස කිරීම නොකළ යුතු ය, යන උපදෙස් ලබා දෙන්නේ ය.

04. අල්ලාහ් පිරිනැමූ දයාද ගෙන හැර දැක්වීම ද ඒ වෙනුවෙන් අල්ලාහ්ට පූර්ණ කෘතඥතාව දැක්වීම ද අත්‍යවශ්‍ය බව හැඟවෙන්නේ ය.

### අභ්‍යාස

**01. පහත ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✕) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

1. සූරතුල් ලුහා. මදනී සූරාව ( )
2. සූරතුල් ලුහා නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමාට සැනසීම ගෙන දීමට ය. වි පහළ ( )
3. දේව දයාද අමතක නොකළ යුතු ය. ( )
4. කැමති නම් පමණක් අනාථයින්ට සැලකිය හැකි ය. ( )

**02. හිස්තැන් පුරවන්න.**

1. සූරතුල් ලුහාවේ ආයත් ...................... දක්නට ලැබේ.
2. මෙම සූරාව ...................... වැනි අය හොඳින් නඩත්තු කළ යුතු ය, යැයි ගෙන හැර දක්වන්නේ ය.
3. සූරා ලුහා යන්නෙහි අදහස ...................... වේ.

### ක්‍රියාකාරකම්

1. සූරා ලුහා මගින් ඔබ ඉගෙන ගත් වැදගත් කරුණු පහක් ලියා ප්‍රදර්ශනය කරන්න.